අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
**OFFICE ON MISSING PERSONS**

---

**මාධ්‍ය නිවේදනය** **2019 අගෝස්තු මස 16**

## <u>යාපනය ප්‍රාදේශීය කාර්යාලය විවෘත කිරීම</u>

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP) විසින් සිය නව ප්‍රාදේශීය කාර්යාලය, යාපනය, ආඩියපතම් මාවත, අංක 124 දරණ ස්ථානයෙහි දී 2019 අගෝස්තු 24 වන දින විවෘත කිරීමට නියමිතය. මෙය මෙම වර්ශය තුළ විවෘත වන තෙවැනි කාර්යාලයයි. මේ වන විට මාතර සහ මන්නාරම යන ප්‍රදේශවල අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කර තිබේ. විවෘත කිරීමේ උත්සවය පාර්ලිමේන්තුවේ ගරු කථානායක සහ ව්‍යවස්ථාදායක සභාවේ ගරු සභාපති කරු ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් හා අමාත්‍ය මනෝ ගනේෂන් මහතාගේ සහභාගීත්වයෙන් පැවැත්වේ.

ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන් සෙවීම සහ අතුරුදහන් වූවන්ට කොතැනක දී කුමක් සිදුවූයේ ද යන්න සෙවීමේ මූලික වගකීම මෙම කාර්යාලයට පැවරී තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල ස්ථාපිත කිරීම පසුගිය දශක හතරකට ආසන්න කාලය තුළ දී විවිධ සන්දර්භයන් තුළ ශ්‍රී ලංකාවෙහි පුළුල් ලෙස සිදු වූ පුද්ගල අතුරුදහන් වීමේ සිදුවීම් හමුවේ අප රටෙහි පීඩාවටපත් දහස් ගණනකට පිළිතුරු සැපයීමේ වගකීම භාරගත් වත්මන් රජය විසින් ගනු ලැබූ වැදගත් ක්‍රියාමාර්ගයකි.

ප්‍රාදේශීය කාර්යාල මගින් අතුරුදහන්වූවන්ගේ පවුල් වලට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත ප්‍රවේශවීමට ඇති හැකියාව මෙමගින් සහතික කෙරේ. පවුලේ සාමාජිකයන්ගේ පැමිණිලි භාර ගැනීම්, පවුල් මුහුණ දෙන පරිපාලනමය ගැටළු පිළිබඳව දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කිරීම් සහ එක් එක් සිදුවීම සම්බන්ධ නඩු කටයුතු විමසීම් ඇතුළු සේවාවන් රාශියක් මෙම කාර්යාල විසින් සපයනු ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සිය ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කිරීම සහ එහි සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම තුළින් වින්දිතයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට කැපවී සිටී.